# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර පනත

[සහතිකය සටහන් කළේ 1973 මාර්තු මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 අප්‍රේල් මස 19 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබා ගත හැකිය

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 15 දරන ශ්‍රී ලංකා
ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර පනත

[සහතිකය සටහන් කළේ 1973 මාර්තු මස 29 වන දින]

එල්. ඩී.—ඕ. 52/72.

**ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය පිහිටුවීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඩු නාමය.

## I වන කොටස

## ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය පිහිටුවීම එහි අරමුණු සහ බලතල

2. (1) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන මණ්ඩලයක් පිහිටුවනු ලැබේ. 5 වන වගන්තිය යටතේ මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් සලකනු ලබන තැනැත්තන්ගෙන් එය සමන්විත වන්නේ ය. ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය පිහිටුවීම.

(2) (1) වන උපවගන්තියෙන් මණ්ඩලයට පවරනු ලැබූ නාමයෙන් මණ්ඩලය සංස්ථාවක් වන්නේය. අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් මණ්ඩලයට ඇත්තේ ය. තවද එකී නාමයෙන් මණ්ඩලය විසින් නඩු පැවරිය හැකි ය; එකී නාමයෙන් මණ්ඩලයට විරුද්ධ ව නඩු පවරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය කොළඹ හෝ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි වෙනත් ස්ථානයක විය යුතු ය.

3. මණ්ඩලයේ පොදු අරමුණු— මණ්ඩලයේ පොදු අරමුණු.

(i) ආණ්ඩුව විසින් සකස් කරන ලද සංවර්ධන වැඩ පිළිවෙළට අනුකූල ව සාමාජීය හා ආර්ථික සංවර්ධනය සඳහා ආණ්ඩුවේ නො වූ විදේශීය හා දේශීය නියෝජ්‍යතන්වවල ආධාර ලබා ගැනීම ;

(ii) මහජනෝපකාර, සාමාජීය හා ආර්ථික සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ දී ආයතනවලට හා වෙනත් මණ්ඩලවලට සහාය වීම ;

1—ජේ 20210—9,857 (73/4)

(iii) කෘෂිකාර්මික හා කාර්මික සංවර්ධනය කෙරෙහි යොමු වූ නිශ්චිත යෝජනා ක්‍රමවලට ආධාර කිරීම, එම යෝජනා ක්‍රම දියුණු කිරීම සහ සම්බන්ධීකරණය කිරීම ;

(iv) කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදනය වැඩි කිරීම සඳහා වූ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමෙහි ලා ආණ්ඩුවේ නො වූ නියෝජ්‍යාත්ව උනන්දු කිරීම ;

(v) ජාත්‍යන්තර සාගිනි නිවීමේ ව්‍යාපාරය සහ වෙනත් ඒ හා සමාන පිට රට ආයතන, සංගම් හෝ සමිති සමග සහයෝගී වීම

යන මේවා වේ.

මණ්ඩලයේ බලතල.

4. මණ්ඩලයේ අරමුණු ඉටුකර ගැනීම පිණිස—

(අ) ආණ්ඩුවේ නො වූ මාර්ගයන්ගෙන් මුදල් වශයෙන් වූ, උපකරණ වශයෙන් වූ හෝ වෙන යම් ආකාරයක වූ ආධාර හා පරිත්‍යාග ලැබීමට ;

(ආ) අවශ්‍ය යැ යි මණ්ඩලය විසින් සලකනු ලැබිය හැකි නියමයන් හා කොන්දේසි පිට ඒ ආධාර හා පරිත්‍යාග බෙදා හැරීමට ;

(ඇ) මුදල් වශයෙන්, භාණ්ඩ වශයෙන් හෝ සේවා වශයෙන් විදේශීය මාර්ගයන්ගෙන් ආධාර ලබන, ආණ්ඩුවේ නො වූ නියෝජ්‍යාත්වවල කටයුතු සමාලෝචනය කිරීමට හා සම්බන්ධීකරණය කිරීමට ;

(ඈ) 3 වන වගන්තියෙහි නිශ්චිත ව සඳහන් කාර්යයන් සඳහා, ආණ්ඩුවේ නො වූ මාර්ගයන්ගෙන් මුදල් වශයෙන්, භාණ්ඩ වශයෙන් හෝ සේවා වශයෙන් ආධාර ලබන ආණ්ඩුවේ නො වූ සංවිධානවල කටයුතු පිළිබඳ ව වාර්තා ඉල්ලීමට ;

(ඉ) අනුමත කළ යෝජනා ක්‍රමවලට ආධාර දීම සඳහා ආණ්ඩුවේ නො වූ විදේශීය හා දේශීය සංවිධාන සමග අදහස් හුවමාරු කිරීමට ;

(ඊ) ආණ්ඩුවේ නො වූ මාර්ගයන්ගෙන් ආධාර වශයෙන් ලැබුණු වෙළෙඳ භාණ්ඩ විකිණීමට හෝ අන් ලෙසකින් බැහැර කිරීමට ;

(උ) යම් චංචල හෝ නිශ්චල දේපළක් මිලට ගැනීමට, සතු ව සිටීමට, බද්දට හෝ කුලියට ගැනීමට හෝ උකස් ගැනීමට;

(ඌ) ගිවිසුම් හෝ එකඟවීම්වලට එළඹීමට සහ ඒ ගිවිසුම් හෝ එකඟවීම් වෙනස් කිරීමට හෝ පරිච්ඡින්න කිරීමට ;

(එ) යම් චංචල හෝ නිශ්චල දේපළක් විකිණීමට, පාලනය කිරීමට, පැවරීමට, හුවමාරු කිරීමට, උකස් කිරීමට, බදු දීමට, කුලියට දීමට හෝ අන් ලෙසකින් බැහැර කිරීමට ;

(ඒ) මණ්ඩලය විසින් කරනු ලබන සේවයන් සඳහා ගාස්තු නියම කර අයකර ගැනීමට ;

(ඔ) මුදල් වශයෙන්, භාණ්ඩ වශයෙන් හෝ උපකරණ වශයෙන් ආණ්ඩුවේ නො වූ විදේශීය මාර්ගයන්ගෙන් ලැබුණා වූ ද දේශීය ප්‍රතිග්‍රාහකයන් වෙත බෙදා හරිනු ලැබුවා වූ ද ආධාර වල හෝ පරිත්‍යාගවල රුපියල් අගය උචිත අවස්ථාවන් හි දී ඒ ප්‍රතිග්‍රාහකයන්ගෙන් අය කර ගැනීමට ;

(ඕ) ප්‍රවෘත්ති හා අධ්‍යාපන සේවා පිහිටුවා පවත්වා ගෙන යෑමට ;

(ක) මණ්ඩලයේ කාර්යයන් සඳහා, චෙක් පත්, නෝට්ටු හෝ වෙනත් හුවමාරු පත්‍ර ලිවීමට, පිළිගෙළ කිරීමට, පිළිගැනීමට, පිටසන් කිරීමට හා වට්ටම් කිරීමට ;

(ග) මණ්ඩලය පිහිටුවීමේ ප්‍රාථමික හෝ ආනුෂංගික සියලු වියදම් සහ එහි කටයුතු පාලනය කිරීමේ හා පරිපාලනය කිරීමේ වියදම් ගෙවීමට ; සහ

(ච) මණ්ඩලයේ අරමුණු මුදුන්පත් කරගැනීම සඳහා අවශ්‍ය යැ යි, ආනුෂංගික යැ යි හෝ වැඩදායී යැ යි මණ්ඩලය විසින් සලකනු ලැබිය හැකි වෙනත් සියලු කටයුතු ඉටු කිරීමට

මණ්ඩලයට බලය ඇත්තේ ය.

5. (1) මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වන්නේ ය:— මණ්ඩලයේ සංයුතිය.

(අ) අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන (මෙහි මින් මතු "පත් කරනු ලැබූ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සභාපතිවරයෙක්, උප සභාපතිවරයෙක් සහ වෙනත් සාමාජිකයන් තිදෙනෙක් ; සහ

(ආ) (මෙහි මින් මතු "නම් කරනු ලැබූ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) පහත සඳහන් පරිදි නම් කරනු ලැබූ වෙනත් සාමාජිකයන් හය දෙනෙක් :—

(i) එයින් සාමාජිකයන් දෙදෙනෙක් ක්‍රම සම්පාදන හා රැකීරක්ෂා විෂය භාර අමාත්‍යවරයා විසින් ස්වකීය අමාත්‍යාංශය යටතේ වූ යම් දෙපාර්තමේන්තුවකට අනුබද්ධ හෝ එහි සේවය කරන නිලධරයන් අතුරින් නම් කරනු ලැබූ නිලධරයන් දෙදෙනෙක් වන්නාහ ;

(ii) එයින් එක් සාමාජිකයෙක් වැවිලි කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයා විසින් ස්වකීය අමාත්‍යාංශය යටතේ වූ යම් දෙපාර්තමේන්තුවකට අනුබද්ධ හෝ එහි සේවය කරන නිලධරයන් අතුරින් නම් කරනු ලැබූ නිලධරයෙක් වන්නේ ය ;

(iii) එයින් එක් සාමාජිකයෙක් කෘෂිකර්ම විෂය භාර අමාත්‍යවරයා විසින් ස්වකීය අමාත්‍යාංශය යටතේ වූ යම් දෙපාර්තමේන්තුවකට අනුබද්ධ හෝ එහි සේවය කරන නිලධරයන් අතුරින් නම් කරනු ලැබූ නිලධරයෙක් වන්නේ ය ;

(iv) එයින් එක් සාමාජිකයෙක් ස්වදේශ කටයුතු විෂය භාර අමාත්‍යවරයා විසින් ස්වකීය අමාත්‍යාංශයේ යම් දෙපාර්තමේන්තුවකට අනුබද්ධ හෝ එයි සේවය කරන නිලධරයන් අතුරින් නම් කරනු ලැබූ නිලධර යෙක් වන්නේ ය;

(v) එයින් එක් සාමාජිකයෙක් වාරි මාර්ග, විදුලි බල හා මහා මාර්ග කටයුතු විෂය භාර අමාත්‍යවරයා විසින් ස්වකීය අමාත්‍යාංශයේ යම් දෙපාර්තමේන්තුවකට අනුබද්ධ හෝ එහි සේවය කරන නිලධරයන් අතුරින් නම් කරනු ලැබූ නිලධරයෙක් වන්නේ ය.

(2) යම් තැනැත්තකු ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකු ව සිටිනහොත් හෝ ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකු බවට පත්වුවහොත් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකුව නො සිටිනහොත් හෝ එසේ පුරවැසියකුව සිටීම අවසන් කළහොත් ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ තව දුරටත් එසේ සිටීමට නුසුදුසු වන්නේ ය.

(3) මණ්ඩලයේ සෑම පත් කරනු ලැබූ සාමාජිකයෙක්—

(අ) මිය යෑම, අස් වීම හෝ ඉවත් කරනු ලැබීම හේතුකොටගෙන ඔහු කලින් සිය ධුරය අත් හැරියහොත් මිස ඔහුගේ පත් වීමේ දින සිට අවුරුදු තුනක කාලයක් තුළ ධුරය දරන්නේ ය; තවද

(ආ) නැවත පත් කරනු ලැබීමට ද සුදුසු වන්නේ ය:

එසේ වුව ද, මණ්ඩලයේ සාමාජිකයකුගේ ධුරයක පුරප්පාඩුවක් පිරවීම සඳහා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක් තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ගත නො වී ඇති කොටස තුළ ධුරය දරන්නේ ය.

(4) සෑම නම් කරනු ලැබූ සාමාජිකයෙක්, මිය යෑමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය අත්හැරියහොත් මිස මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ඔහු පත් කරනු ලැබූ අවස්ථාවේ ඔහු විසින් දරන ලද තනතුරෙහි ධුර කාලය සහ අවුරුදු තුනක කාලය යන දෙකින් වඩා කෙටි කාලය තුළ ධුරය දරන්නේ ය.

(5) නම් කරනු ලැබූ සාමාජිකයකු නො වන, මණ්ඩලයේ සාමාජිකයකුට අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස් විය හැකි ය.

(6) අමාත්‍යවරයා විසින් යම් හේතුවක් නො දක්වා මණ්ඩලයේ යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කළ හැකි ය; එසේ වුව ද 5 වන වගන්තියේ (1) (ආ) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබූ සාමාජිකයකු ඒ සාමාජිකයා නම් කළ අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැති ව එසේ ඉවත් නො කළ යුතු ය.

(7) මණ්ඩලයේ යම් සාමාජිකයකු (6) වන උපවගන්තිය යටතේ ඉවත් කරනු ලැබීම යම් අධිකරණයක දී ප්‍රශ්න නො කළ යුතු ය.

(8) අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ප්‍රමාණ අනුව මණ්ඩලයේ මුදල්වලින් මණ්ඩලයේ සියලුම සාමාජිකයන්ට හෝ ඉන් යම් සාමාජිකයකුට පාරිශ්‍රමික ගෙවිය හැකි ය.

(9) අසනීප වීම නිසා හෝ වෙනත් දුබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර ව සිටීම නිසා හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු සිය ධුරයේ කාර්යයන් ඉටු කිරීමට තාවකාලික ව අපොහොසත් වන අවස්ථාවක, ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා සුදුසු හා යෝග්‍ය තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කළ හැකි ය.

(10) අසනීප වීම නිසා හෝ වෙනත් දුබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ මණ්ඩලයේ සභාපති හෝ උප සභාපති සිය ධුරයේ යුතුකම් ඉටු කිරීමට තාවකාලික ව අපොහොසත් වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ සභාපති හෝ උප සභාපති වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා සුදුසු හා යෝග්‍ය තැනැත්තකු අමාත්‍ය වරයා විසින් පත් කළ හැකි ය.

(11) සභාපති හෝ උප සභාපති කලින් ස්වකීය ධුරය අත්හැරිය අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ සභාපතිගේ හෝ උප සභාපතිගේ ධුර කාලයෙන් ගත නො වී ඇති කොටස තුළ ධුරය දැරීම සඳහා වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කළ හැකි ය.

(12) මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි සාමාජිකයකු පත් කරනු ලැබීමේ හෝ නම් කරනු ලැබීමේ යම් දෝෂයක් තිබීමේ හේතුව නිසා පමණක් මණ්ඩලයේ කිසි ම ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු නො විය යුතු ය.

6. (1) සභාපති විසින් අවශ්‍ය යැ යි සලකනු ලැබිය හැකි කවර විටක වුව ද මණ්ඩලයේ රැස්වීම් පැවැත්විය යුතු ය. මණ්ඩලයේ රැස්වීම.

(2) මණ්ඩලයේ රැස්වීමක ගණ පූරණය සාමාජිකයන් පස් දෙනකු විය යුතු අතර, ඉහත කී විධිවිධානවලට යටත් ව, මණ්ඩලයේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල දී කෙරෙන කටයුතු පිළිබඳ ස්වකීය කාර්ය පරිපාටිය මණ්ඩලය විසින් විධිමත් කළ හැකි ය.

(3) සභාපති හෝ ඔහු නො පැමිණි විටක උප සභාපති හෝ මණ්ඩලයේ සියලු රැස්වීම්වල මූලසුන දැරිය යුතු ය.

(4) මණ්ඩලය විසින් එහි රැස්වීම්වල වාර්තා සටහන් කිරීමට සැලැස්විය යුතු ය.

7. මණ්ඩලයේ කාර්යයන් ඉටු කිරීම සහ එහි බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් සාමාන්‍ය හෝ විශේෂ ලිඛිත විධාන කළ හැකි අතර ඒ විධානවලට අනුකූල ව ක්‍රියා කිරීම මණ්ඩලයේ යුතුකම විය යුතු ය. මණ්ඩලයට කෙරෙන විධාන.

8. මණ්ඩලයේ සියලුම නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූල ව සහ එහි කාර්යයන් සඳහා රාජ්‍ය නිලධර යන් ලෙස සැලකිය යුතු ය. මණ්ඩලයේ නිලධරයන් හා සේවකයන් රාජ්‍ය නිලධරයන් ලෙස සැලකිය යුතු බව, 19 අධි.

මණ්ඩලය අල්ලස් පනතේ අර්ථානුකූල උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව. 26 අධි.

9. මණ්ඩලය අල්ලස් පනතෙහි අර්ථානුකූල උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව, ඒ පනතේ විධිවිධාන මණ්ඩලය කෙරෙහි ද මණ්ඩලය සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

## II වන කොටස

### මණ්ඩලයේ කාර්ය මණ්ඩලය

නිලධරයන් හා සේවකයන් පත් කිරීම.

10. (1) මණ්ඩලය විසින් මණ්ඩලයේ කාර්යයන් කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය යැ යි සලකනු ලැබිය හැකි නිලධරයන්, සේවකයන් හා අනුයෝජිතයන් මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට පත් කළ හැකි ය.

(2) මණ්ඩලයේ ඒ නිලධරයන්ට, සේවකයන්ට හා අනුයෝජිතයන්ට මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයකින් හා ප්‍රමාණ අනුව පාරිශ්‍රමික ගෙවිය යුතු අතර එසේ ම නිශ්චය කරනු ලැබිය හැකි සේවා කොන්දේසිවලට ඔවුන් යටත් විය යුතු ය.

මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් මණ්ඩලයට ඇති බලතල.

11. (1) මණ්ඩලය විසින් පහත සඳහන් කාර්යයන් සඳහා රීති සෑදිය හැකි ය :—

(අ) මණ්ඩලයේ කාර්ය මණ්ඩලය පත් කිරීම, උසස් කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය ;

(ආ) කාර්ය මණ්ඩලයේ පඩි හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම ;

(ඇ) කාර්ය මණ්ඩලයේ සේවා නියම හා කොන්දේසි ; සහ

(ඈ) මණ්ඩලයේ කටයුතු පරිපාලනය කිරීම.

(2) යම් රාජ්‍ය නිලධරයකු මණ්ඩලයේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ කැමැත්ත ඇති ව, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාලයක් සඳහා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලික ව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනි ම කැමැත්ත ඇති ව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(3) යම් රාජ්‍ය නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලික ව පත් කරනු ලැබූ අවස්ථාවක 1957 අංක 48 දරන මෝටර් ගමනාගමන පනතේ 9 වන වගන්තියේ (2) වන උපවගන්තිය අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව ඒ නිලධරයා කෙරෙහි ද ඒ නිලධරයා සම්බන්ධයෙන් ද අදාළ වන්නේ ය.

(4) යම් රාජ්‍ය නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිර ව පත් කරනු ලැබූ අවස්ථාවක, 1957 අංක 48 දරන මෝටර් ගමනාගමන පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව ඒ නිලධරයා කෙරෙහි ද ඒ නිලධරයා සම්බන්ධයෙන් ද අදාළ වන්නේ ය.

(5) නිශ්චිත කාල සීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමඟ ගිවිසුමකට එළඹ සිටින යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයෙහි යොදවා ගනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින් මණ්ඩලය යටතේ සේවය කරනු ලබන යම් කාල සීමාවක් ඒ ගිවිසුමේ බැඳීම ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුව යටතේ කරනු ලබන සේවය ලෙස සලකනු ලැබේ.

(6) යම් තැනැත්තකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලික ව පත් කරනු ලැබූ අවස්ථාවක ඒ මණ්ඩලයේ යම් ස්ථිර සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඔහු යටත් වන්නේ ය.

## III වන කොටස

## මණ්ඩලයේ මුදල්

12. (1) මණ්ඩලයට මණ්ඩලයේම අරමුදලක් තිබිය යුතු අතර එම අරමුදල ඒ මණ්ඩලය විසින් පවත්වා ගෙන යා යුතු ය. මණ්ඩලයේ අරමුදල.

(2) (අ) ඒකාබද්ධ අරමුදලෙන් රුපියල් දෙලක්ෂයක ප්‍රදානයක් සහ ජාතික රාජ්‍ය සභාවේ යෝජනා සම්මතයෙන් කලින් කල ඒකාබද්ධ අරමුදලෙන් ගෙවිය හැකි තවත් යම් යම් ප්‍රදාන ;

(ආ) මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව ම වූ දින ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර කම්ටුවේ බැරට මහජන බැංකුවේ තිබෙන මුදල් ;

(ඇ) ආණ්ඩුවේ වූ හෝ ආණ්ඩුවේ නො වූ යෝජනා ක්‍රමවලට බෙදා හැරිය සියලු ආධාරවලින් මණ්ඩලයට අය විය හැකි සේවා ගාස්තු ;

(ඈ) මේ පනතේ 4 වන වගන්තිය යටතේ කලින් කල මණ්ඩලයට අය වන සියලු මුදල් ; සහ

(ඉ) භාර ආඥා පනතේ 20 වන වගන්තියේ නියමයන් අනුව මණ්ඩලයට ලැබිය හැකි භාර අරමුදල් මණ්ඩලයේ අරමුදලට ගෙවිය යුතු ය.

(3) (අ) මේ පනත යටතේ වූ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී ද ස්වකීය කාර්යයන් ඉටු කිරීමේ දී ද මණ්ඩලය විසින් දරන ලද වියදම් ගෙවීම සඳහා අවශ්‍ය සියලු මුදල් ;

(ආ) මණ්ඩලය පිහිටුවීමේ දී ද කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ දී ද උපකරණ මිල දී ගැනීමේ දී ද දරන ලද මූලික වියදම් සහ මණ්ඩලය පිහිටුවීමට අවශ්‍ය හෝ ඊට ආනුෂංගික වෙනත් වියදම් ;

(ඇ) මණ්ඩලය අනුමත කරන යෝජනා ක්‍රම වෙනුවෙන් කලින් කල ගෙවිය යුතු වන්නා වූ සියලු මුදල් මණ්ඩලයේ අරමුදලෙන් ගෙවිය යුතු ය.

13. මණ්ඩලයේ මුදල් වර්ෂය එක් එක් වර්ෂයේ ජනවාරි මස පළමු වන දිනයෙන් ආරම්භ වන මාස දොළහක කාලය විය යුතු ය. මණ්ඩලයේ මුදල් වර්ෂය.

1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධි විධාන අදාළ වීම.

**14.** 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධි විධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මණ්ඩලයේ මුදල් පාලනය කෙරෙහි අදාළ විය යුතු ය.

## IV වන කොටස

### පොදු විධිවිධාන

රීති.

**15.** (1) රීති සෑදීමට මේ පනතින් නියමිත හෝ එයින් බලය දී ඇති කරුණු සියල්ල හෝ ඉන් කිසිවක් සඳහා මණ්ඩලය විසින් රීති සෑදිය හැකි ය.

(2) මණ්ඩලය විසින් සාදනු ලබන කිසි ම රීතියක් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන තුරු බල නො පැවැත්විය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයකුට හෝ ඔහුගේ දේපළට විරුද්ධව හෝ කිසිම රිට් ආඥාවක් නිකුත් නො කළ යුතු බව.

**16.** මණ්ඩලයට විරුද්ධ ව ගෙනෙනු ලබන යම් නඩුවක දී මණ්ඩලයේ සාමාජිකයකුට විරුද්ධ ව පෞද්ගලික ව හෝ ඔහුගේ දේපළට විරුද්ධ ව හෝ කිසිම රිට් ආඥාවක් නිකුත් නො කළ යුතු ය.

මේ පනත යටතේ හෝ මණ්ඩලයේ මෙහෙයවීම අනුව කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව සැලසීම.

**17.** මේ පනත යටතේ හෝ මණ්ඩලයේ මෙහෙයවීම යටතේ මණ්ඩලයේ යම් නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධ ව කිසි ම සිවිල් හෝ අපරාධ නඩුවක් නො පැවරිය යුතු ය.

මූල මණ්ඩල පත් කිරීම.

**18.** (1) මණ්ඩලයේ අරමුණු ඉටු කිරීම හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික යම් විශේෂ කටයුත්තක් හෝ කටයුතු සාමාන්‍යයෙන් දියුණු කිරීම පිණිස මණ්ඩලයට උපදෙස් දීමේ සහ සහාය වීමේ කාර්යය සඳහා අවශ්‍ය යැ යි මණ්ඩලය විසින් සලකනු ලැබිය හැකි තැනැත්තන්ගෙන් සමන්විත වන මූල මණ්ඩල පත් කිරීම මණ්ඩලය විසින් කළ හැකි ය.

(2) මණ්ඩලයේ සභාපති විසින් එබඳු යම් මූල මණ්ඩලයක් හෝ මූල මණ්ඩල කැඳවන්නා වශයෙන් මණ්ඩලයේ සාමාජිකයකු පත් කළ යුතු අතර සභාපති විසින් නම් කරනු ලැබූ මණ්ඩලයේ නිලධර යකු ඒ එක් එක් මූල මණ්ඩලයේ ලේකම් වශයෙන් ක්‍රියා කළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ පත් කරනු ලැබූ යම් මූල මණ්ඩලයක හෝ මූල මණ්ඩලයක යම් සාමාජිකයකුගේ පත් වීම කිසිම හේතුවක් නො දක්වා ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ බලය මණ්ඩලයට තිබිය යුතු ය.

**19.** මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වන දින සිට ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර කමිටුවේ අනුප්‍රාප්තිකා විය යුතු අතර, ඒ අනුව, මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව ම වූ දිනයෙහි ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර කමිටුවට අයත් ව තිබූ සියලු වත්කම්, බැරකම්, කාර්ය මණ්ඩලය සහ උපකරණ, මණ්ඩලයේ වත්කම්වල, බැරකම්වල, කාර්ය මණ්ඩලයේ සහ උපකරණවල කොටසක් වශයෙන් සැලකිය යුතු ය.

ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර කමිටුවේ වත්කම්වලට හා බැරකම්වලට මණ්ඩලය අනුප්‍රාප්තවීම.

**20.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"අමාත්‍යවරයා" යන්නෙන් අග්‍රාමාත්‍යවරයා විසින් කෘෂිකර්ම විෂය පවරනු ලැබ සිටින අමාත්‍යවරයා අදහස් වේ; තවද

"ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර කමිටුව" යන්නෙන් 1962 සැප්තැම්බර් මාසයේදී ඉඩම්, වාරි මාර්ග හා විදුලි බල අමාත්‍යවරයා විසින් පත් කරන ලද කමිටුව අදහස් වේ.

අර්ථ නිරූපණය.

ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.